# 12 ශ්‍රේණිය ව්‍යාපාර අධ්‍යයනය - 6 වන සතිය - ජූනි 8 සිට 12 දක්වා

නිපුණතාව 10 - ප්‍රවාහන හා සැපයුම් සේවා ව්‍යාපාරවල සාර්ථකත්වය සඳහා දායකවන ආකාරය විමර්ශනය කරයි.

නිපුණතා මට්ටම 10.2 - අවස්ථාවට උචිත ප්‍රවාහන ක්‍රමයක් හා මාධ්‍යයක් තෝරයි.

උචිත ප්‍රවාහන මාධ්‍යයක් තෝරා ගැනීමේදී සලකා බැලිය යුතු කරුණු කිහිපයක් පහත දැක්වේ.

**1.භාණ්ඩයේ ස්වභාවය**

මෙහිදී භාණ්ඩයේ ස්වරූපය,කල්පැවැත්ම,බර,වටිනාකම ආදී සාධක මත තෝරා ගන්නා ප්‍රවාහන මාධ්‍යය වෙනස් වේ.

උදා-ඛනිජ තෙල් ප්‍රවාහනය සඳහා බවුසර් යොදා ගැනීම.

දැව ප්‍රවාහනය සඳහා ලොරි රථ යොදා ගැනීම.

මාළු ප්‍රවාහනය සඳහා ශීතාගාර සහිත ලොරි රථ යොදා ගැනීම.

**2.පිරිවැය**

ප්‍රවාහනය සඳහා දැරීමට සිදුවන මුළු වියදම පිරිවැය වේ.ප්‍රවාහන පිරිවැය වැඩිවීම භාණ්ඩයේ මිළ වැඩි වීමටද හේතුවන නිසා ඒ පිළිබඳව වඩාත් සැලකිලිමත් විය යුතු වේ.

**3.වේගය**

සමහර අමුද්‍රව්‍ය හා භාණ්ඩ ඉක්මනින් ප්‍රවාහනය කිරීම අවශ්‍ය වේ.නෂ්‍ය වීම,ගුණත්වය අඩුවීම එයට හේතුවයි.වේගවත් ප්‍රවාහනය තුළින් වැයවන කාලය අවම වේ.ඒ තුළින් ප්‍රවාහන කටයුතු කාර්යක්ෂම කර ගැනීමට අවස්ථාව ලැබේ.නිදසුන්-මාළු,එළවළු,පළතුරු,මී කිරි

**4.දුර ප්‍රමාණය**

දුර ප්‍රමාණය අනුවද තෝරා ගන්නා මාධ්‍ය වෙනස් වේ.දුර ප්‍රමාණය අනුව මාධ්‍ය සඳහා වැය වන පිරිවැය ද වෙනස් වේ.

**5.ධාරිතාව**

ප්‍රවාහන මාධ්‍යයක් මගින් වරකට ගෙන යා හැකි භාණ්ඩ හා මගීන් ප්‍රමාණය ධාරිතාව වේ.ප්‍රවාහනය කිරීමට බලාපොරොත්තු වන ප්‍රමාණය අනුව සුදුසු මාධ්‍යයක් තෝරා ගත යුතුය.

උදා-විශාල තොග ලොරි රථ මගින්ද කුඩා භාණ්ඩ තොගයක් බෙදා හැරීමේ වැන් රථ මගින්ද ප්‍රවාහනය කිරීම.

**අභ්‍යාස**

1.ප්‍රවාහන ක්ෂේත්‍රයේ වර්ධනය වෙමින් පවතින ප්‍රවණතා 5ක් නම් කරන්න.